# මුහුදු වැද්දන්ගේ සමාජ-සංස්කෘතික වෙනස්වීම පිළිබඳ සමාජ මානව විද්‍යාත්මක අධ්‍යයනයක් (නැගෙනහිර වෙරළබඩ කලාපයේ වාකරේ ප්‍රදේශය ඇසුරෙන්)

**පෙරේරා බී.එන්.ජී,[1] අමරවීර එන්.ජී.එම්.[2]**

මානව ජන සම්මිශ්‍රණයේ බලපෑම මත වියැකෙමින් යන, සමාජ ආන්තිකකරණයට ලක් ව ඇති සුළුතර සමාජ කණ්ඩායමක් ලෙස වාකරේ මුහුදු ආදිවාසි ප්‍රජාව හඳුනාගත හැකි ය. මෙම අධ්‍යයනය මගින් මුහුදු ආදිවාසී ප්‍රජාවගේ සමාජ-සංස්කෘතික වෙනස්වීම පිළිබඳ මානව විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම අරමුණ වේ. මෙහිදී වාකරේ ප්‍රදේශයේ කුංජන්කුලම් ග්‍රාමීය මුහුදු ආදිවාසි ප්‍රජාව සසම්භාවී නියදිය ඔස්සේ තෝරා ගන්නා ලදි. ප්‍රාථමික දත්ත රැස්කිරිමේදී නිරීක්ෂණය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමයන් ද ද්විතියික දත්ත රැස්කිරිමේදී ග්‍රාම නිලධාරි වාර්තා යොදාගන්නා ලදි. මෙම ප්‍රජාව දඹානේ ආදිවාසි ප්‍රජාවගෙන් ඛණ්ඩනය වී අම්බල වරිගය, උතුරු වරිගය, මොරාණ වරිගය, පලාන වරිගය ආදි ලෙස වරිග බෙදීමක් සහිත ය. වැදි භාෂාව වර්තමානයේ මළ භාෂාවක් බවට පත් ව ඇති අතර දෙමළ මිශ්‍ර සිංහල භාෂාව කතා කරයි. අතීතයේ ප්‍රධාන ජීවනෝපාය ලෙස ආවේණික තාක්ෂණික ක්‍රමයන් උපයෝගි කරගනිමින් ධීවර රැකියාවේ නිරත වුව ද වර්තමානයේ හේන් ගොවිතැන, මිරිදිය මත්ස්‍ය රැකියාව සහ සත්ත්ව පාලනයේ නිරත වේ. නෑ යකුන් ඇදහීම දක්නට ලැබුනත් මුහුදු ආදිවාසින් කිරිකොරහා නැටීම වාර්ෂිකව සිදු නොකරයි. කිරි අම්මා වැදිම වැනි අභිචාරවිධි වර්තමානයේ දී වියැකීයමින් පවති. උතුරු-නැගෙනහිර යුද්ධයෙන් පීඩා විඳිමින් අභ්‍යන්තර අවතැන්කරුවන් ලෙස දීර්ඝ කාලයක් අවතැන් කඳවුරු තුළ ජීවත්වීම තුළ ඔවුන්ට ආවේණික සමාජ-සංස්කෘතික අගයන් වෙනස්වීමට ලක් ව ඇත. දමිළ ප්‍රජාව සමඟ විවාහයන් සිදුකර ගැනීම වැනි තත්ත්වයන් තුළ දමිළ-හින්දු සංස්කෘතියේ බලපෑමේ ප්‍රතිඵල ලෙස වර්තමානයේ මුහුදු ආදිවාසි ප්‍රජාවගේ සමාජ-සංස්කෘතික අගයන් වියැකීයමින් ඇත. සංවර්ධන ව්‍යාපෘතිවල අහිතකර බලපෑම ලෙස මුල් ජනාවාස අහිමි වීම, අධ්‍යාපනය මගින් ඇතිකරන ලද උඩුකුරු චලනතාව, ආර්ථික සාධක පදනම් කරගත් තල්ලු කිරීමේ සහ ඇද ගැනිමේ සාධක හේතුවෙන් ආදිවාසි තරුණ ප්‍රජාව නගරයට සංක්‍රමණය වීම ආදී බලපෑම් හේතුවෙන් ද මෙම සමාජ-සංස්කෘතික අගයන් වෙනස් වී ඇත. මුහුදු ආදිවාසි ප්‍රජාව සම්ප්‍රදායික සමාජ-සංස්කෘතික ජිවිතයෙන් වෙන්වෙමින් වර්තමානය වන විට මහා සමාජ-සංස්කෘතිකයට අනුකලනය වන සුළුතර සමාජ කණ්ඩායමක් වශයෙන් නිගමනය කළ හැක. මුහුදු ආදිවාසි ප්‍රජාවට ආවේණික සමාජ-සංස්කෘතික උරුමයේ වටිනාකම සහ ඊට එල්ල වී ඇති බලපෑම් හඳුනාගනිමින් මෙම ප්‍රජාව සංරක්ෂණය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. ඒ සඳහා ආදර්ශ මොඩලයක් ලෙස දඹාන ආදිවාසි ප්‍රජාව සංරක්ෂණයට යොදගත් ප්‍රතිපත්ති සහ යෝජනා භාවිත කළ හැකිය.

**ප්‍රමුඛ පද :** මුහුදු ආදිවාසි ප්‍රජාව, සංස්කෘතික විසරණය,ආන්තිකරණය, උරුම සංරක්ෂණ

[1] සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. nimanthagayashanperera@gmail.com